අධ්‍යාපන මාධ්‍ය ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම සාධාරණීකරණය කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන තවත් තර්කයක් වන්නේ නව දනුම ලබාගැනීමට සහ විදේශීය අධ්‍යාපනය ලැබීමට නම් ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබිය යුතුය යන්නයි. මෙහිදී

තුළ අකුරක්වත් හොඳින් නොහඳුනන විදේශ භාෂාවක් හොඳින් ප්‍රගුණ කර උසස් අධ්‍යාපනය ද අවසන් කළ හැකි බවයි. අද කොළඹ ජාතික රෝහලේ අධ්‍යක්ෂවරයා වන හෙක්ටර් වීරසිංහ මහතා අධ්‍යාපනය ලබා ඇත්තේ එලෙසය. ඒ එක් උදහරණයක් පමණක් වන අතර අවශ්‍ය නම්

හැසිරවීමේ හැකියාව තිබුණත්, වෙනත් කිසිදු කටයුත්තක් සාර්ථක කළ නොහැකි වූ බවට උදහරණ කොතෙකුත් සැපයිය හැක.

එමෙන්ම මෙරට සිටින සාර්ථක ව්‍යාපාරිකයන් පිළිබඳ සලකා බැලීමේදී පෙනී යන කාරණය වන්නේ ඔවුන්ගෙන් සාතිෂය බහුතරය සිංහල

ඉංග්‍රීසි කළ පමණින් අමුතු අවස්ථාවන් උදවන්නේ නැත. ඒ වෙනුවට සිදුවන්නේ පළමුව සිංහල භාෂාවත් දෙවනුව සිංහල ජාතියත් විනාශවීම පමණි.

මෙරට අධ්‍යාපන මාධ්‍යය ඉංග්‍රීසිය වීම අලුත් අත්දකීමක් නොවන අතර මෙරට අධ්‍යාපනය ස්වභාෂාවෙන්

එම ජාතියේ ජාතික, ආර්ථික සහ සංස්කෘතික අංගයන් නගාසිටුවිය හැක ය... පදනමේ සිටය. මෙම අදහ... ඉදිරිපත් වූද සිට ක්‍රියාත්මක වූ ද සිට එය පරාජය කිරීමට, කකුලෙන් ඇදීමට කටයුතු කළ පුද්ගලයන් සිටියත් අද ආපසු හැරී බලනවිට පැහැදිලි වන්නේ එම ප්‍රයත්නය බොහෝදුරට සාර්ථක වී ඇති බවයි.

සිටීමට නොහැකි වන ලෙස ප්‍රශ්නය අවසන්වීමට නියමිතව තිබුණත්, එම අවස්ථාවේදී නම් සිංහල ජාතිය අවාසනාවන්ත වී ඇත. අප එලෙස සඳහන් කරන්නේ 1948 දී සුද්දන් මෙරටින් පිටවී යැමත් සමගම ඉංග්‍රීසිය ද අහෝසිවී යැම සිදුවිය යුතුව තිබුණත් එය සිදු නොවන බැවිනි. ඉංග්‍රීසීන්ට පෙර විවිධ ජාතීන් මෙරට

ඇමරිකානු ආර්ථිකයට හිමිවී තිබූ අනභිභවනීයත්වය අහෝසි වී ඇති අතර තරගකරුවන් සටනට පිවිස ඇත. මෙම තත්ත්වය තුළ අනාගතයේ දිනෙක අද ඉංග්‍රීසිය හිමි ඇති අනභිභවනීයත්වය ද අහෝසි වී යනවා ඇත. එදිනට කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ දේශන චීන, ස්පාඤ්ඤ හෝ ... වෙනත් භාෂාවකින් හෝ ... භාෂා

මොහොතේ හෝ වටහා ගැනීම පිළිබඳ අප සතුටු විය යුතුය. නමුත් අපට සතුටු විය නොහැක්කේ මෙරට ස්වභාෂා අධ්‍යාපනයට එරෙහිවී ... ක්වාන් යූ ගේ මග යන බව පවසන අපගේ උගතුන් සහ දේශපාලනඥයන් මේ අවසාන මොහොතේ හෝ මවු භාෂාවේ ... වටහා නොගැනීම පිළිබඳවය.

# ජාතියට මග හෙළි කළ ප්‍රාඥයා

# මෙත්තානන්ද

**එල්. එච්. මෙත්තානන්ද මහතාගේ 42 වැනි ගුණ සමරුව වෙනුවෙන් මෙම ලිපිය පළවේ**

ඒකීය රාජ්‍යය වෙනුවෙන් ද, උතුර සහ නැගෙනහිර භූමියට සිංහල ජනතාවට ඇති අයිතිය වෙනුවෙන් ද, ස්වභාෂා අධ්‍යාපනය සහ බෞද්ධ උරුමය වෙනුවෙන් ද අනුපමේය සේවයක් කරන ලද ලොකුසකු හේවා මෙත්තානන්ද හෙවත් එල්. එච්. මෙත්තානන්ද මහතා දයෙන් සමුගෙන අදට වසර 42 ක් සම්පූර්ණ වේ. එතුමාගේ 42 වැනි ගුණානුස්මරණය යෙදී තිබෙන්නේ කොටි ත්‍රස්තවාදය පරාජය කළ පසුබිමක් තුළ සහ ස්වභාෂා අධ්‍යාපනය පිළිබඳ යළිත් කතිකාවක් ආරම්භ වී ඇති පසුබිමක වීම සුවිශේෂ තත්ත්වයකි.

කොටි ත්‍රස්තවාදයේ සම්භවය පිළිබඳ අනවබෝධයෙන් යුතුව අදහස් දක්වන පුද්ගලයන් ප්‍රකාශ කරන්නේ, එම ත්‍රස්තවාදයට හේතුව සිංහල පමණක් රාජ්‍ය භාෂාව කිරීම බවයි. නමුත් එම ත්‍රස්තවාදය පිළිබඳ හොඳින් කරුණු සලකා බැලීමේදී පැහැදිලි වන්නේ උතුර සහ නැගෙනහිර යන ප්‍රදේශවල ඓතිහාසිකව දෙමළ ඊළාම් රාජ්‍යයන් පැවතියාය යන විශ්වාසය පදනම් කරගෙන මෙම ප්‍රශ්නය ඇතිවී ඇති බවයි, මෙත්තානන්ද මහතා 1950 සහ 60 යන දශකවලදී රචනා කරන ලද ලිපි පරිශීලනය කිරීමෙන් එතුමා ද එම ස්ථාවරයේ සිට ඇති බව පැහැදිලි වේ. එතුමා එම ස්ථාවරයේ සිටිමින් උතුර සහ නැගෙනහිර යන භූමියට සිංහල ජනයාට ද ඇති අයිතිය වෙනුවෙන් සටන් කර ඇති අතර, අනාගතයේදී යම් ගැටුම්කාරී තත්ත්වයක් නිර්මාණය වුවහොත් එයට ද මුහුණදීම සඳහා ශක්තිමත් හමුදවක අවශ්‍යතාව අවධාරණය කර ඇත. එබැවින් දශක 3 ක් පුරා පැවැති කොටි ත්‍රස්තවාදය අවසන් කිරීම සඳහා දූරදර්ශීව කටයුතු කළ පුද්ගලයකු ලෙස මෙත්තානන්ද මහතා හැඳින්විය හැක. මෙත්තානන්ද මහතා මහනුවර ධර්මරාජ, කොළඹ නාලන්ද සහ ආනන්ද යන විද්‍යාලවල විදුහල්පතිවරයා ලෙස කටයුතු කර ඇති අතර එම පාසල්වල ශිෂ්‍ය භට කණ්ඩායම් දියුණු කිරීමට සහ ශිෂ්‍ය භටයන් ආරක්ෂක හමුදවට සම්බන්ධ කිරීම සම්බන්ධයෙන් විශාල උනන්දුවකින් කටයුතු කර ඇත. කොටි ත්‍රස්තවාදය තීරණාත්මකව පරාජය කළ සටනේ නියමුවන් වූ ජනරාල් සරත් ෆොන්සේකා සහ ගෝඨාභය රාජපක්ෂ මහතා එලෙස කොළඹ ආනන්දයෙන් අධ්‍යාපනය ලබා ශිෂ්‍ය භටයන් ලෙස කටයුතු කර හමුදවට එක්වූ දෙදෙනකු පමණි. එබැවින් කොටි ත්‍රස්තවාදය තීරණාත්මකව පරාජය කොට ඇති මේ අවස්ථාවේ එම ජයග්‍රහණයේ කොටස්කරුවකු වූ මෙත්තානන්ද මහතා ද සිහි කිරීම කෘතවේදී සැමගේ යුතුකමකි.



මෙත්තානන්ද මහතා රට, ජාතිය, ආගම රැකගැනීම සඳහා බොහෝ ක්ෂේත්‍රවල කටයුතු කර ඇති අතර, එක් ක්ෂේත්‍රයක් වන්නේ ස්වභාෂා අධ්‍යාපනය නගාසිටුවීමයි. එද ස්වභාෂා අධ්‍යාපනයට එරෙහි වූ බලවේග විද්‍යාව සහ ගණිතය වැනි විෂයන් සිංහලෙන් ඉගැන්විය හැකිද යන්න ප්‍රශ්නය මතු කරමින් එය කඩාකප්පල් කිරීමට සූදනම් වූ අවස්ථාවේදී ඒ සඳහා ප්‍රායෝගික විසඳුම් සැපයීම සඳහා පුරෝගාමීව කටුයතු කළ පුද්ගලයෙකි මෙත්තානන්ද මහතා. එක් අතකින් ස්වභාෂා අධ්‍යාපනය නගාසිටුවීම සඳහා ප්‍රායෝගික වැඩපිළිවෙළක් ක්‍රියාවට නංවා ඇති අතර අනෙක් අතට ස්වභාෂා අධ්‍යාපනයට එරෙහි වූ මතවාදයන්ට එරෙහිව මතවාදී අරගලයක ද නිරත වී ඇත. අන්‍යාගමික බලපෑම් පරාජය කිරීම, ස්වභාෂා අධ්‍යාපනය නගාසිටුවීම, උතුර සහ නැගෙනහිර සිංහල බෞද්ධ උරුමය ආරක්ෂා කිරීම සහ සිංහල පමණක් රාජ්‍ය භාෂාව කිරීම වෙනුවෙන් පෙනී සිට කටයුතු කළ එතුමා ඒ සඳහා වූ දේශපාලන ව්‍යාපාරයක අවශ්‍යතාව ද නිවැරදිව අවබෝධ කරගෙන ඇත. 1956 දී මහජන එක්සත් පෙරමුණ බලයට ගෙන ඒම සඳහා එතුමා පුරෝගාමීව කටයුතුකොට ඇත්තේ එබැවිනි. 1956 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ, මහජන එක්සත් පෙරමුණ බලයට පත්වීම සඳහා මෙත්තානන්ද මහතා ඇතුළු ජාති හිතෛෂීන් විසින් බුද්ධ ජයන්තියට සමගාමීව පිහිටුවූ 'බෞද්ධ තොරතුරු කොමිෂන් සභාව සහ එහි වාර්තාව හේතු පාදක වුවත් බලයට පත්වූ පසුව එම පෙරමුණේ නායකයන් කටයුතු කළ ආකාරය පිළිබඳ මෙත්තානන්ද මහතා සෑහීමකට පත් නොවූ බවත් කනගාටුවට පත්වූ බවත් එම කාලසීමාවෙහි එතුමා කළ කී දේ අනුව අපට නිගමනය කළ හැක. මෙත්තානන්ද මහා ධර්ම සමාජ පක්ෂය නමින් දේශපාලන පක්ෂයක් ආරම්භ කොට ඇත්තේ එම කාලසීමාවේදීය. එයින් අපට පැහැදිලි වන්නේ මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුව ගොඩනැඟීම සඳහා දයක වූ පක්ෂ සිංහලත්වය වෙනුවෙන් කටයුතු නොකරන බව එතුමාට අවබෝධ වීම විය යුතුය. ඉන්පසු කාලීනව මෙත්තානන්ද මහතා විවිධ පක්ෂ සමග කටයුතු කර ඇතත්, ඔහු සිංහල බෞද්ධ අයිතීන් රැකීම වෙනුවෙන් වෙනුවෙන් වෙනම පක්ෂයක් බිහි කළ යුතුය යන ස්ථාවරයේ දැඩිව පසුවී ඇති බව පැහැදිලිය.

මෙත්තානන්ද මහතා ජීවතුන් අතර සිටි කාලයේදී මෙන්ම අදත් පසක් වන්නේ එම සත්‍යයයි. අද කොටි ත්‍රස්තවාදය විනාශවීමෙන් පසුව ද උතුර සහ නැගෙනහිර භූමියට සිංහල බෞද්ධයන්ට ඇති අයිතිය අහෝසි කිරීම සඳහා වූ සාකච්ඡා සම්මන්ත්‍රණ මේ දක්වා අවසන් වී නොමැත. එමෙන්ම මේ මොහොත වන විට සිංහල ස්වභාෂා අධ්‍යාපනය අහෝසි කර නැවතත් ඉංග්‍රීසිය අධ්‍යාපන මාධ්‍ය බවට පත් කිරීම සඳහා වූ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. මීට අමතරව විවිධ අන්‍යාගමික බලවේග ඉතා සියුම්ව බෞද්ධයන් අන්‍යාගමිකකරණය කිරීමේ ව්‍යාපෘතිය ද ක්‍රියාත්මකව පවතී. මේ සියල්ල සිදුවෙමින් පවතින්නේ 1956 දී බලයට පැමිණි මහජන එක්සත් පෙරමුණ ආණ්ඩුව පිහිටුවීම සඳහා දයක වූ පක්ෂවල වත්මන් පරපුර බලයේ සිටින අතරතුරදීමය. මෙම කරුණුවලින් පැහැදිලි වන්නේ එද මෙත්තානන්ද මහතා එම පක්ෂවලට විකල්ප පක්ෂයක් ලෙස ධර්ම සමාජ පක්ෂය ගොඩනැඟීමට ගත් තීරණය කොතරම් නිවැරදි ද යන්න නොවේද?

මෙත්තානන්ද මහතාගේ 42 වැනි ගුණ සමරුව යෙදෙන මේ මොහොතේ ඒ මහතාගේ දේශපාලන කටයුතුවල පසු විපරමක යෙදෙන්නේ නම් ඒ මහතා පැහැදිලි ලෙසම ප්‍රාඥයකු ලෙස හැඳින්විය හැක. අපට එතුමා ප්‍රාඥයකු ලෙස හැඳින්විය හැක්කේ එතුමා තුන් කල් බලා ගත් තීන්දු තීරණ සෑම එකක්ම නිවැරදි වී ඇති බැවිනි. දන් සිංහල ජනතාව කළ යුත්තේ උතුරට සහ නැගෙනහිරට ඇති අයිතිය ආරක්ෂා කිරීම සඳහා, ස්වභාෂා අධ්‍යාපනය ආරක්ෂා කිරීම සඳහා, අන්‍යාගමික බලවේගවලින් බෞද්ධාගම ආරක්ෂා කිරීම සඳහා මෙත්තානන්ද මහතා පෙන්වා දුන් මඟ ගැනීමය.

**එරික්**

## ගෝඨාභය ඝාතනයට......

14 පිටුවෙන්

ගොඩනැගිල්ලේ වූ තරප්පු පෙළක් යට සැඟවූ සියල්ලන් එම ස්ථානයෙන් පිටත්ව ගියේ පසුද යළි පැමිණෙන අරමුණෙනි.

එහෙත් පසුදින වැල්ලවත්තේ නිවස වෙත පැමිණියේ තිරුබන් හා බලාජි පමණි. කන්නන් නැමිණ නොතිබිනි. බලාජිත් තිරුබනුත් ඒ පිළිබඳ කථාබහ කරමින් සිටියදී කන්නන්ගෙන් තිරුබන්ට ඇමතුමක් ලැබෙන්නට විය.

"මල්ලි..මම දන් එන්නෙ නැහැ..ඒත් ඔතන්නට දන් ත්‍රීවීල් එකේ කදීර් එනව...ත්‍රීවීල් එකේ බඩු ටික දගෙන උඹල මෝදර පූසාරිගෙ ගෙදරට වරෙන් එතන හොඳයි වැඩේ සෙට් කරන්න...ඇමතුම දුන් කන්නන් කීවේ එවැන්කි.

කන්නන් කී ලෙසම ටික වේලාවක් ගත වෙද්දී කදීර් එම ස්ථානයට ළඟා වූ අතර පසුව තිරුබන් හා කදීර් අධිබල බෝම්බය ඇතුළු උපකරණ සියල්ල ත්‍රිරෝද රථයේ පටවාගෙන මෝදර බලා පිටත් වූහ. එහෙත් බලාජි වෙනත් කටයුත්තක් සඳහා එහි රැඳී සිටින්නට විය.

තිරුබන් හා කදීර් මෝදර පිහිටි පූසාරිගේ නිවසට බෝම්බය ඇතුළු උපකරණ රැගෙන එනවිට එම ප්‍රදේශයට තද වර්ෂාවක් ඇද හැලෙමින් තිබිණි. ඔවුන් එහි පැමිණෙන විටත් කන්නන්ද පූසාරිගේ නිවසට පැමිණ සිටියේය.

පූසාරිගේ නිවසේ සිට ත්‍රිරෝද රථයට බෝම්බය ඇටවීම මොවුන්ගේ අරමුණ වී තිබුණද ඇද හැලෙමින් තිබුණු වර්ෂාව තුරල් නොවූයෙන් එම කටයුත්ත පසුදිනට කල් තැබූ සියල්ලෝ අවසානයේ පූසාරිගේ නිවස පිහිටි ඉඩමේ අධිබල බෝම්බය ඇතුළු සියලු උපකරණ වළදමා පසු දින යළි පැමිණීමට කථිකා කරගෙන තම තමන් රැඳී සිටි ස්ථාන වෙත පිටත් වූහ....

කතිකා කරගත් පරිදිම පසුදින දහවල් යළි කන්නන්, තිරුබන් හා කදීර් පූසාරිගේ නිවසස වෙත ආහ.

හිහිසුණු කාර්යය ආරම්භ කෙරිණි. ඒ සඳහා අවශ්‍ය තීන්ත පැස්සුම් උපකකරණ ඇතුළු සෑම දෙයක්ම කන්නන් රැගෙනවිත් තිබිණි.

මුලින්ම ත්‍රිරෝද රථයේ පෙට්‍රල් ටැංකිය ගලවා ඉවත් කළ කන්නන් පසුව කිලනොච්චියෙන් රැගෙන ආ ටැංකිය ඊට සවි කරනු ලැබීය

අනතුරුව ඒ අති හිහිසුණු ප්‍රහාරයට අධිබල බෝම්බය ත්‍රිරෝද රථයට සවි කරේණි. සියල්ල නිමවා තිරෝද රථයේ හැඩලයම බෝම්බය පුපුරා හැරීමේ ස්විචද සවි කළ කන්නන් එක් අවස්ථාවක සැවොම භීතියට පත් කරමින් එහි ක්‍රියාකාරිත්වය අත්හද බැලුවේ තමන් නියම ඉංජිනේරුවකු බව කාටත් වටහා දෙමිනි.

අවසානයේ ත්‍රිරෝද රථය කදීර්ට භාර කරමින් කන්නන් හා තිරුබන් ජීවිතයේ අන්තිම වතාවට ඔහුගෙන් සමු ගනු ලැබූහ.

පසු දින හිමිදිරියේ ත්‍රිරෝද රථයට ගොඩ වූ කදීර් තම ගොදුර සොයා ඉගිලෙන්නට විය.

එය ගෝඨාභය රාජපක්ෂ මහතාට බෝම්බ ප්‍රහාරය එල්ල වූ දිනට සතියකට පමණ පෙර දිනයකි.

ඒ වන විට කදීර් සිටියේ කොළඹ කොම්පඤ්ඤවීදියේ කුමාරරත්නම් පාර මන්සන්දියේය.

එය තිරුබන්, මක්කල් සහ කදීර් ආරක්ෂක ලේකම්වරයා ඝාතන ප්‍රහාරය සඳහා ඔත්තු බැලූ ප්‍රබල මර්මස්ථානයක්ව තිබූ ස්ථානයකි වේලාව උදෑසන 7.00 පසුවී ගෙවී ගොස් තිබුණේ විනාඩි කිහිපයකි.

ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා ගමන් ගත් මෝටර් රථය සහිත ආරක්ෂක රථපෙළ ඒ මොහොතේ ගංගාරාම මාවතින් පැමිණ කුමාරරත්නම් මන්සංධිය ඔස්සේ ධාවනය වෙමින් තිබිණි. මේ බව තිරුබන්ගේ පණිවුඩයකට අනුව කලින් දන සිටි කදීර් ආරක්ෂක ලේකම්වරයා බිලි ගැනීමේ මිලේච්ඡ ප්‍රහාරයට සැරසුණි. එහෙත් කදීර් ත්‍රිරෝද රථය පණගන්වාගෙන ඉලක්කය වෙත ළඟ වනවාත් සමගම මහමග ධාවනය වෙමින් තිබූ මෝටර් රථයක් ආරක්ෂක ලේකමවරයා ගමන් කළ රථයත් කදීර් පැමිණි බෝම්බ ඇටවූ ත්‍රිරෝද රථයත් අතරින් ධාවනය වූයේ දෛවෝපගත ලෙසිනි.

ඒත් සමඟම කදීර්ගේ ඉලක්කය වැරදී ගියේ කදීර් හැර අන් කිසිවකුත් කිසිවක්ම නොදන්නා අයුරිනි..

එය මේ දේශයේ පිනට ආරක්ෂක ලෙකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ජීවිතය එල්ටීටීඊයේ ප්‍රහාරයකින් බේරුණු ප්‍රථම අවස්ථාව බවද සටහන් කළ යුතුව තිබේ.

**ආරක්ෂක ලෙකම්වරා ආ රථපෙළට පිත්තල හන්දියේදී කදීර් කඩා වැදුණු හැටි ලබන සතියේ**

1/11/2009